රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2018

මගේ අංකය: EST-7/ALOWN/06/0719/25(VII)
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.07.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම්

විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් 2018.08.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

| | පරීක්ෂණය පැවැත්වෙන පැයකට දීමනාව | ලිපිකරු/යතුරු ලේඛක/පරිගණක ක්‍රියාකරු සහය හා තැපැල් ගාස්තු වශයෙන් වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම (උපරිම එක් නිලධරයෙකු සඳහා පමණි) | අවසාන වාර්තාව එහි සම්පිණ්ඩනය පිළියෙළ කිරීම |
|---|---|---|---|
| **01. පරීක්ෂණ නිලධාරී** | | | |
| **I. විශ්‍රාමික** | | | |
| (අ) මාණ්ඩලික නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය | රු. 1000/- | රු. 5000/- | රු. 10,000/- |
| (ආ) යටත් නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය | රු. 800/- | රු. 5000/- | රු. 10,000/- |
| (ඇ) කනිෂ්ඨ නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය | රු. 800/- | රු. 5000/- | රු. 10,000/- |
| **II. රාජ්‍ය සේවයේ නියුතු** | | | |
| (අ) මාණ්ඩලික නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය | රු. 800/- | | රු. 10,000/- |
| (ආ) යටත් නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය | රු. 800/- | | රු. 10,000/- |
| (ඇ) කනිෂ්ඨ නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය | රු. 800/- | | රු. 10,000/- |

| | | | |
|---|---|---|---|
| **02.** පැමිණිල්ල මෙහෙයවන නිලධාරී<br><br>(අ) මාණ්ඩලික නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය<br><br>(ආ) යටත් නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය<br><br>(ඇ) කනිෂ්ඨ නිලධරයෙකුට විරුද්ධව පැවැත්වෙන පරීක්ෂණය | <br><br>රු. 500/-<br><br>රු. 500/-<br><br>රු. 500/- | | <br><br>රු. 3000/-<br><br>රු. 2000/-<br><br>රු. 1500/- |
| **03**. පරීක්ෂණයේ කටයුතු කරන යතුරු ලේඛකයෙකුට/ ලඝු ලේඛකයෙකුට/ පරිගණක ක්‍රියාකරුවෙකුට පරීක්ෂණය පැවැත්වෙන පැයකට | රු. 400/- | | |

02. ඉහත සඳහන් දීමනාවලට අමතරව විශ්‍රාමික පරීක්ෂක නිලධරයෙකුට ඔහු විශ්‍රාම යන විට රජයේ සේවයේ දැරූ තනතුර පදනම් කර ගෙන සහ රාජ්‍ය සේවයේ නියුතු පරීක්ෂක නිලධරයෙකුට ඔහු දරන තනතුර පදනම් කරගෙන ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

03. පැමිණිල්ල මෙහෙයවනු ලබන නිලධරයාට ද ඉහත පළමු ඡේදයේ අංක 02 යටතේ සඳහන් දීමනාවලට අමතරව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් තිබේ.

04. චූදිත නිලධරයා වෙනුවෙන් පෙනී සිටින රැකවරණ නිලධරයාට ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 29:8 උප වගන්තියේ විධිවිධාන අනුව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ද ලබා ගත හැකිය.

05. විනය පරීක්ෂණ නිලධරයෙකු විනය පරීක්ෂණය සඳහා තමා නියම කළ ස්ථානයට, නියමිත දිනට, නියමිත වේලාවට පැමිණියේ මුත්, ඔහු වගකිව යුතු වන්නේ නැති කරුණු නිසා තම විනය පරීක්ෂණය වෙනත් දිනකට කල් තබන්නේ නම් සම්පූර්ණ විනය පරීක්ෂණ සැසියක් සඳහා ගෙවිය යුතු මුදලින් එක් අඩක් ඔහුට ගෙවිය යුතුය. සම්පූර්ණ විනය පරීක්ෂණ සැසියක් යනුවෙන් අදහස් කරනුයේ පැය 04ක කාල සීමාවකි.

06. රාජ්‍ය සේවයේ නියුතු පරීක්ෂණ නිලධරයෙකුගේ අවසාන වාර්තාව යතුරු ලියනය කිරීම වෙනුවෙන් රාජ්‍ය සේවයේ නියුතු ලඝුලේඛකයෙකුට/ යතුරු ලේඛකයෙකුට හෝ පරිගණක ක්‍රියාකරුවෙකුට 2003.12.11 දිනැති 12/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව ගෙවීම් කළ හැකිය.

07. මාස 06ක කාලයක් තුළ විනය පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව විනය බලධරයාට භාර දෙන්නේ නම් පමණක් තම කාර්යය සඳහා දිරිගැන්වීමක් ලෙස ඉහත පළමු ඡේදයේ සඳහන් සියලු දීමනාවලට අමතරව රු. 6,000/- ක දිරි දීමනාවක් විනය පරීක්ෂණ නිලධරයාට ගෙවිය හැකිය. නියමිත මාස 06ක කාල සීමාව තුළ ඇති වූ, පරීක්ෂණ නිලධරයාට පාලනය කරගත නොහැකි හේතුවක් මත එම වාර්තාව භාර දීම ප්‍රමාද වී ඇත්නම් හා ඒ බව සනාථ කර ගත හැකි නම් ඔහුට ගෙවනු ලබන අමතර රු. 6000/-ක දීමනාව ද අඩු නොකර ගෙවිය හැකිය. එම දීමනාව අඩු නොකර ගෙවීමේ දී එසේ තීරණය කිරීමට හේතු වූ කරුණු විනය බලධරයා විසින් පැහැදිලිව සටහන් කර තැබිය යුතුය.

08. කෙසේ වුව ද අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාද වන අවස්ථාවල දී මෙම චක්‍රලේඛයේ පළමු හා දෙවන ඡේදවල සඳහන් පරිදි විනය පරීක්ෂණ නිලධරයාට ගෙවනු ලබන සියලුම දීමනාවලින් පහත සඳහන් ආකාරයට අඩුකර ගෙවිය යුතුය.

I. මාස 12කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 5%ක්
II. මාස 18කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 10%ක්
III. මාස 24ක් හෝ එයට වැඩි කාලයක් ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවලින් 25%ක්

එසේ වුවත් විධිමත් විනය පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව විනය බලධරයාට භාර දීම මාස 12කට වඩා ප්‍රමාද වීම, පරීක්ෂණ නිලධරයාට පාලනය කර ගත නොහැකි හේතුවක් නිසා බවට සනාථ කර ගත හැකි නම් ඔහුට ගෙවනු ලබන දීමනා අඩු නොකර ගෙවීම කළ හැකිය. එසේ දීමනාව අඩු කිරීමකින් තොරව ගෙවීමේ දී එසේ තීරණයක් ගැනීමට හේතු වූ කරුණු විනය බලධරයා විසින් පැහැදිලිව සටහන් කර තැබිය යුතුය.

09. මෙම කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2005.10.20 දිනැති 19/2005 හා 2011.11.22 දිනැති 19/2005 (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ද, 2008.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 02 සහ 2014.07.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 03/2014 ද මෙයින් අවලංගු කරනු ලැබේ.

10. 2018 වසරේදී මේ සඳහා අතිරේක ප්‍රතිපාදන නොඉල්ලා සිටිය යුතුය.

11. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදි.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය